# සාමාන්‍ය සමයේ දස නවවන සතිය
# බ්‍රහස්පතින්දා

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 18: 21–19:1

**"සත් වාරයක් නොව සත් වාර සත්තෑ වාරයක් කමා විය යුතු ය"යි මම ඔබට කියමි.**

එකල පේදුරු ජේසුස් වහන්සේ වෙත අවුත් "ස්වාමිනි, මට විරුද්ධව පව් කරන මාගේ සහෝදරයාට මා කී වාරයක් කමා විය යුතු ද? සත් වාරයක්දැ"යි උන්වහන්සේගෙන් ඇසීය. ජේසුස් වහන්සේ ඔහුට කතා කොට, "සත් වාරයක් නොව, සත් වාර සත්තෑවකැ"යි වදාළ සේක.

"ස්වර්ග රාජ්‍යය මෙවැන්නකට උපමා කළ හැකිය. සිය දාසයන් සමග ගණන් හිලවු බැලීමට තීරණය කර ගත් රජෙක් විය. ඔහු එසේ කරන්නට පටන් ගත් කල රුපියල් දෙකෝටියක් පමණ ණය වූ කෙනෙක් ඔහු වෙත ගෙනෙන ලද්දේය. ණය ගෙවීමට ඔහුට කිසිවක් නොතිබුණු බැවින් ස්වාමියා ඔහු ද ඔහුගේ බිරිඳ හා දරුවන් ද ඔහු සන්තක සියල්ලද විකුණා ණය ගෙවන්නට අණ කළේය. එවිට ඒ දාසයා දණින් වැටී, "මා ගැන ඉවසන්න. මුළු ණය ගෙවන්නෙමි"යි කීය. ඒ දාසයාගේ ස්වාමියා ඔහු ගැන අනුකම්පාවෙන් පිරී ඔහු ණයෙන් නිදහස් කොට කමාව දුන්නේය.

එහෙත් ඒ දාසයා නික්ම ගොස්, තම සහකාර දාසයන්ගෙන් තමාට රුපියල් දෙසීයක් පමණ ණයට සිටි කෙනෙකු දැක, ඔහුගේ බෙල්ල මිරිකා

ඔහු අල්ලා ගෙන "මාගේ ණය ගෙවාපන්නැ"යි කීය. එවිට ඔහුගේ සහකාර දාසයා බිම වැටී, "මා ගැන ඉවසන්න. ණය ගෙවන්නෙමි"යි කන්නලව් කරමින් කීය. එහෙත් ඔහු නොඉවසා ණය ගෙවන තෙක් ඔහු හිර අඩස්සි කළේය.

ඔහුගේ සහකාර දාසයෝ සිදු වූ දේ දැක, අතිශයින් ශෝක වී අවුත් සිදු වූ සියල්ල තම ස්වාමියාට දැන්වූහ. එවිට ඔහුගේ ස්වාමියා ඔහු කැඳවා කතා කොට, "කමකට නැති දාසය, නුඹේ ඉල්ලීම නිසා මම ඒ ණය සියල්ල නුඹට කමා කළෙමි. මා නුඹට අනුකම්පා කළාක් මෙන්ම, නුඹත් නුඹේ සහකාර දාසයාට අනුකම්පා කළ යුතුව තිබුණා නොවේදැ"යි ඇසීය. ඔහුගේ ස්වාමියා කෝප වී ඔහු තමාට ගෙවිය යුතු සම්පූර්ණ ණය ගෙවන තෙක් ඔහු වධකයන්ට භාර දුන්නේය. ඔබක් එකිනෙකා තමාගේ සහෝදරයාට මුළු සිතින් කමා නොකරන්නහු නම් ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේ ද එසේම ඔබටත් කමා නොකරනු ඇත."

ජේසුස් වහන්සේ මේ වචන වදාරා නිම කොට, ගලීලයෙන් නික්ම ජෝර්දානෙන් එගොඩ ජුදයේ පළාත්වලට පැමිණි සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.